**හම්බන්තොට ප්‍රාදේශීය සභාව**
**හම්බන්තොට දිස්ත්‍රික්කය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 17 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජුනි 30 දින ද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2019 දෙසැම්බර් 31 දිනට හම්බන්තොට ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | ඉකුත් වර්ෂයට අදාලව ලැබිය යුතු රු. 6,579,300 ක් වූ මුද්දර ගාස්තු ආදායම සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයේදී සභාව සතු දේපල 06 ක් සංවර්ධනය කිරීම වෙනුවෙන් දරන ලද රු. 4,453,124 ක් ප්‍රාග්ධනිත කර නොතිබූ අතර දේපල 03 ක් අලුත්වැඩියා කිරීම සඳහා දරණ ලද රු. 502,364 ක් ප්‍රාග්ධනිත කර තිබුණි. | පුනරාවර්ථන වැය හා ප්‍රාග්ධන වැය නිවැරදිව හඳුනාගත යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iii) | සමාලෝචිත වර්ෂය අවසානයට රු. 678,880 ක් වූ ලී බඩු හා සවි කිරීම්, යන්ත්‍රසූත්‍ර හා උපකරණ යටතේ ගිණුම් ගතකර තිබුණි. | වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iv) | සමාලෝචිත වර්ෂයේදී මිලදී ගත් රු. 136,000 ක් වූ පරිගණකය, ගිණුම්ගත කර නොතිබූ අතර රු. 157,480 ක් වටිනා තරාදි දෙකක් යන්ත්‍ර හා උපකරණ යටතේ දෙවරක් ගිණුම්ගත කර තිබුණි. | වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (v) | ඉකුත් වර්ෂයේදී පෙර ගෙවුම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ රු. 285,727 ක් වූ වියදම් සමාලෝචිත වර්ෂයේදී වියදමක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | වියදම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (vi) | සභාව සතු ගොඩනැගිලි 10 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | වත්කම් තක්සේරු කර ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**(ආ) නොසැසඳුනු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ගිණුම් විෂයයන් 06 කට අදාළ එකතුව රු. 282,151,897 ක් වූ ශේෂ, ඊට අදාළ උපයෝගී ලේඛන / ලේඛනවල දැක්වෙන ශේෂ අතර එකතුවෙහි රු. 18,305,647 ක් වූ අසමානතාවයක් පැවතුණි. | ගිණුමේ දැක්වෙන ශේෂ වලට අදාල උපයෝගී ලේඛන නිවැරදිව ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වේ. | උපලේඛනය එකතු කිරීමේදී ආරම්භක ශේෂයන් අත්හැරීම සිදු වීමත්, වෙනස පරීක්ෂා කර හඳුනා ගැනීමට කටයුතු කරන බව සහ වෙනසට හේතුව හඳුනා ගෙන ඉදිරි ගිණුමට ඇතුළත් කර ඉදිරිපත් කරමි. |

**(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| එකතුව රු. 34,287,568 ක් වූ ගිණුම් විෂයයන් 10 කට අදාලව විගණනයට අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | වත්කම් සභාවට පවරා ගෙන තක්සේරු කිරීමට කටයුතු කරන බව සහ උපලේඛන පිළිතුරු සමඟ ඉදිරිපත් කරමි. |

## 1.4 අනුකූල නොවීම

### 1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 (2) වගන්තිය | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි දියුණු කළ ප්‍රදේශ කාලීනව හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ප්‍රමාණවත් කාර්යය මණ්ඩලයක් නොමැති වීමෙන් දියුණු කළ ප්‍රදේශ හඳුනා ගැනීමට නොහැකි වූ බවත් ඉදිරියේදී කාර්යය මණ්ඩලය ලැබුණු පසු දියුණු ප්‍රදේශ හඳුනා ගැනීමට කටයුතු කරමි. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති සංග්‍රහයේ රීති 193 | අයවැය සමඟ අය හා වැය විෂයයන් සඳහා අතිරික්තතා හා ඌණතා වලට හේතු දැක්වෙන ප්‍රකාශයක් දෙසැම්බර් 31 දිනට පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | අතිරික්තතා හා ඌණතා වලට හේතු දැක්වෙන ප්‍රකාශයක් පිළියෙල කර පිළිතුරු සමඟ ඉදිරිපත් කරමි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| i. | මු. රෙ. 371(5) | 2016 වර්ෂයේ සිට පැවති රු. 226,527 ක් වූ අත්තිකාරම සමාලෝචිත වර්ෂයේදීත් පියවා නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | මෙම ශේෂය වර්ෂ කිහිපයක සිට ඉදිරියට එමින් පවතින ශේෂයක් බව දන්වා සිටිමි. |
| ii. | මු. රෙ. 702 (3) | කොන්ත්‍රාත් සම්බන්ධව අත්සන් කරනු ලබන ගිවිසුම් වල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | සමාලෝචිත වර්ෂය සඳහා අත්සන් කරන ලද ගිවිසුම්වල පිටපත් පිළිතුරු සමඟ ඉදිරිපත් කරමි. |
| (ඉ) | රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ 2020 ජනවාරි 30 දිනැති අංක PFD / RED / COPA / 2019 / 01 දරණ ලිපියේ 04 ඡේදය | වාර්ෂිකව කාර්යසාධන වාර්තාව සකස් කර නොතිබුණි. | කාර්යසාධන වාර්තා වාර්ෂිකව පිළියෙල කිරීමට කටයුතු කළ යුතුවේ. | වාර්ෂික කාර්යය සාධන වාර්තාවක් සකස් කර නොමැති බවත් 2020 වර්ෂයේදී සකස් කර ගිණුම් සමඟ ඉදිරිපත් කරමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 33,342,475 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 12,488,338 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2019 ඇස්තමේන්තුගත ආදායම | 2019 බිල් කළ ආදායම | 2019 රැස් කළ ආදායම | 2019 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2018 ඇස්තමේන්තුගත ආදායම | 2018 බිල් කළ ආදායම | 2018 රැස් කළ ආදායම | 2018 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 793,076 | 780,264 | 870,515 | 719,849 | 1,988,492 | 2,631,265 | 1,833,323 | 1,304,694 |
| කුලී | 17,066,300 | 16,119,465 | 15,617,700 | 21,200 | 8,455,900 | 5,603,000 | 5,553,900 | 39,400 |
| බලපත්‍ර ගාස්තු | 17,900,000 | 19,147,337 | 19,089,587 | 715,879 | 11,813,700 | 16,644,801 | 16,559,851 | 790,080 |
| වෙනත් ආදායම් | 14,847,500 | 24,821,402 | 9,901,168 | 30,637,785 | 7,491,300 | 6,291,823 | 1,870,591 | 21,195,890 |
| එකතුව | 50,606,876 | 60,868,468 | 45,478,970 | 32,094,713 | 29,749,392 | 31,170,889 | 25,817,665 | 23,330,064 |

### 2.2.2 වරිපනම් හා බදු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවසානයට ලැබිය යුතු වරිපනම් බදු රු. 674,787 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබූ අතර මින් රු. 309,315 ක් 2015 වර්ෂයට අදාළ විය. | හිඟ වරිපනම් බදු ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | හිඟයෙන් රු. 105,768 ක් ද 2019 වර්ෂයේ බිල් කල ආදායමෙන් රු. 247,762 ක් අයකරගෙන ඇති බවත්, 2019 අප්‍රේල් මස සිට විෂයය නිලධාරියෙකු නොසිටීම නිසා දේපල තහනමට ලක් කර නීතිමය කටයුතු කිරීමට හෝ හිඟ වරිපනම් අය කර ගැනීමට නොහැකි වූ බව සහ 2020 වර්ෂයේ එම අඩුපාඩු නිවැරදි කරන බව දන්වමි. |
| (ආ) | වරිපනම් දේපල වසර 05 කට වරක් තක්සේරු කළ යුතු වූවත් 2011 වර්ෂයේ තක්සේරුව මත සමාලෝචිත වර්ෂයටද වරිපනම් බදු අයකර තිබුණි. | වසර 05 කට වරක් තක්සේරුව සංශෝධනය කළ යුතුවේ. | නව තක්සේරුවක් සිදු කර දෙන ලෙස තක්සේරු දෙපාර්තමේන්තුව වෙත කීපවරක් ඉල්ලීම් කර ඇති බවත් මේ වන තෙක් තක්සේරුව සිදු කර දී නොමැති බව දන්වමි. |

### 2.2.3 යන්ත්‍රෝපකරණ කුලී ආදායම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට සභාව සතු යන්ත්‍රෝපකරණ කුලියට ලබා දීම වෙනුවෙන් ලැබිය යුතු රු. 105,308 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ කුලී ආදායම අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | 2019 වර්ෂයේදී මෙම මුදල් අයකර ගැනීමට නොහැකි වූ අතර 2020 වර්ෂය තුළදී අයකර ගැනීමට කටයුතු කරමි. |

### 2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු පිළිවෙලින් රු. 62,018,816 ක් හා රු. 22,702,253 ක් විය. | හිඟ උසාවි දඩ හා මුද්දර ගාස්තු කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | 2019 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු අය කර ගැනීමට කටයුතු කරමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කරුණු විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

#### (අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කරුණු 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබුණද සමාලෝචිත වර්ෂය අවසානය වන විට කරුණු 18 ක් සඳහා පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට කටයුතු කළ යුතුවේ. | ප්‍රාදේශීය සභා පනතේ සඳහන් කාරනා 30 සඳහාම අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට කටයුතු කරමි. |

#### (ආ) කර්තව්‍යයන් ඉටු කිරීමේ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී අයවැයෙන් ප්‍රතිපාදන සලසා තිබූ රු. 656,896 ක් වටිනා ව්‍යාපෘති 03 ක් ක්‍රියාත්මක නොකර ප්‍රතිපාදන සලසා නොතිබූ ව්‍යාපෘති ක්‍රියාත්මක කර තිබුණි. | අයවැය ලේඛනයෙහි ඇතුළත් කර ඇති සංවර්ධන යෝජනා ඉටු කර ගැනීම කෙරෙහි අවධානය යොමු කළ යුතුවේ. | අධික වර්ෂාව නිසා මාර්ග 02 ක් බොරළු දමා සංවර්ධනය කළ නොමැති වූ බවත් අනෙක් මාර්ගය වාරිමාර්ග දෙපාර්තමේන්තුව මඟින් සංවර්ධනය කර ඇති බව දන්වමි. |

**(ඇ) තිරසර සංවර්ධන අභිමතාර්ථ ඉටු කර ගැනීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුළින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීමට දර්ශක හඳුනා ගෙන ඒ අනුව වාර්ෂිකව ඉලක්ක ළඟා කර ගැනීමේ ප්‍රගතිය මැනිය යුතුවේ. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක ලඟාකර ගැනීම සඳහා 2019 වර්ෂයේ අයවැය ලේඛනය හා සිව් අවුරුදු සැලැස්මට සකස් කර ඇති බව දන්වමි. |

## 3.2 මානව සම්පත් කළමනාකරණය

### 3.2.1 සේවක පුරප්පාඩු හා අතිරික්තතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සේවක සංඛ්‍යා සැලැස්මේ අනුමත තනතුරුවල පැවති පුරප්පාඩු 08 ක් පිරවීමට හා අතිරික්තතා 17 ක් විධිමත් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සේවක අතිරික්තතා විධිමත් කර ගැනීමට හා පුරප්පාඩු තනතුරු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | පුරප්පාඩු 08 න් පුරප්පාඩු 04 ක් සඳහා බඳවා ගත් බවත් ඉතිරිය සම්පූර්ණ කර ගැනීමට ඉල්ලීම් කර ඇති බව සහ අතිරික්ත 17 න් එක් තනතුරක් දෙපාර්තමේන්තු අනුමත කාර්ය මණ්ඩලයට අයත් බව දන්වමි. |

## 3.3 වත්කම් කළමනාකරණය

### 3.3.1 පවරා නොගත් වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව විසින් භාවිතයට ගනු ලබන ඉඩම් 29 ක හා ගොඩනැගිලි 07 ක නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | වත්කම් වල නීත්‍යානුකූල අයිතිය සභාවට පවරා ගැනීමට කටයුතු කළ යුතුවේ. | සභාව භුක්ති විඳින ඉඩම් ගොඩනැඟිලි පවරා දෙන ලෙස ප්‍රධාන ලේකම් මඟින් ප්‍රාදේශීය ලේකම් වෙත ඉල්ලීම් කර ඇති බවත් ඉඩම් 13 ක මැනුම් කටයුතු අවසන් කර, ඉන් ඉඩම් 11 කට මැනුම් නියෝගද ලැබී ඇති බවත් ඉතිරිය සඳහා මැනුම් නියෝග ලබා ගැනීමට කටයුතු කරන බව සහ මහවැලි ඉඩම් පවරා ගැනීමට කටයුතු කරමි. |